සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	පුරවැසි අධ්‍යාපනය I	කාලය / நேரம் / Time	පැය 01යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලදී දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ ස්වරූපයක් වන්නේ,
   1. ලිබරල්වාදය
   2. සමාජවාදය
   3. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය
   4. ජාතිකවාදය

2. ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ "වජ්ජි" ජනපදයේ පැවති පාලන ක්‍රමය වනුයේ,
   1. රාජාණ්ඩුක්‍රමය
   2. රදළ ආණ්ඩුක්‍රමය
   3. ලිබරල් පාලන ක්‍රමය
   4. සමූහාණ්ඩු පාලන ක්‍රමය

3. ද්වි පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන රාජ්‍යයකි.
   1. ඉන්දියාව
   2. ඇමරිකා එක්සත් ජනපදය
   3. ශ්‍රී ලංකාව
   4. කියුබාව

4. බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව හඳුන්වනුයේ,
   1. නිදහස ලෙසයි.
   2. සමානාත්මතාවය ලෙසයි.
   3. සාධාරණත්වය ලෙසයි.
   4. අයිතිවාසිකම් ලෙසයි.

5. රාජ්‍යයේ ස්වභාවය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,
   1. මහජන අපේක්ෂාවන් ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන ආයතනයකි.
   2. ස්ථාවර ආයතනයක් ලෙස පැවතීමය.
   3. ජනතාවගේ බහුතර කැමැත්ත මත තෝරා ගැනීමයි.
   4. කලින් කලට වෙනස්වන ආයතනයක් වීමයි.

6. ජාතික රාජ්‍යය පිළිබඳ සංකල්පය ශක්තිමත් කිරීමට දායක වූ දේශපාලන චින්තකයෙකු නොවන්නේ,
   1. ඇරිස්ටෝටල්
   2. නිකොලායි මැකියාවෙලි
   3. ජීන් බොඩෑන්
   4. තෝමස් හොබ්ස්

7. ඒකීය රාජ්‍යයක ලක්ෂණයක් වනුයේ,
   1. තල දෙකක ආණ්ඩු ක්‍රියාත්මක වීම.
   2. ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම.
   3. ඉහළ මන්ත්‍රණ සභාවක් ක්‍රියාත්මක වීම.
   4. මධ්‍යම ආණ්ඩුව යටතේ බලය ඒකරාශී වී තිබීම.

Past Papers Wiki

8. ව්‍යවස්ථාදායකය සතු කාර්යයක් වනුයේ,
   1. යුක්තිය පසඳලීම.
   2. පුරවැසි අයිතිවාසිකම් සුරැකීම.
   3. මුදල් පාලනය.
   4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම.

9. නීතිමය යුතුකමක් වනුයේ,
   1. රජයට නියමිත බදු ගෙවීම.
   2. වැඩිහිටියන්ට ගරු කිරීම.
   3. සිරිත් විරිත් පිළිපැදීම.
   4. සංස්කෘතික අදහස් පිළිගැනීම.

10. 1978 ව්‍යවස්ථාවේ පුරවැසි යුතුකම් පිළිබඳව දක්වා ඇති ව්‍යවස්ථාව කුමක්ද?
   1. 21 වන ව්‍යවස්ථාව
   2. 24 වන ව්‍යවස්ථාව
   3. 28 වන ව්‍යවස්ථාව
   4. 30 වන ව්‍යවස්ථාව

11. බලය යනු,
   1. සමාජ සංවිධානයන්ට පමණක් ඇති දෙයකි.
   2. පෞද්ගලිකව භුක්ති විඳිය යුතු දෙයකි.
   3. රාජ්‍ය පාලන කටයුතු පවත්වා ගැනීමට ඇති හැකියාව.
   4. පුරවැසියන් කොටසක් පමණක් භුක්ති විඳින දෙයකි.

12. දේශපාලන දෘෂ්ටිකෝණයට අනුව බලයේ ස්වරූපය පැහැදිලි නොවන ප්‍රකාශය වනුයේ,
   1. බලය හසුරුවන අය තමන්ට කැමති ආකාරයට බලය හැසිරවීම.
   2. තම බලයට යටත්වන අය පාලනය කිරීමට ඇති හැකියාව.
   3. කැමැත්තට අවනත නොවන විට බල කිරීම මඟින් අවනතභාවය ලබා ගැනීම.
   4. ආර්ථික බලය ඇති පිරිස විසින් අනෙක් අය මෙහෙයවීමේ හැකියාව.

13. ඒකීය ආණ්ඩු ක්‍රමයක් පවතින රාජ්‍යයන්ට උදාහරණ වනුයේ,
   1. මහා බ්‍රිතාන්‍ය
   2. ඇමරිකාව
   3. ස්විස්ටර්ලන්තය
   4. ඕස්ට්‍රේලියාව

14. ලංකාවේ පළමු නගරසභා වනුයේ,
   1. ගාල්ල
   2. මාතර
   3. කොළඹ
   4. මහනුවර

15. පළාත් ආණ්ඩුකාරයා සතු බලතලයක් වනුයේ,
   1. පළාත් අයවැය ලේඛනය සකස් කිරීම.
   2. මධ්‍යයම ආණ්ඩුව හා පළාත් ආණ්ඩුව අතර සම්බන්ධීකරණය සිදු කිරීම.
   3. පළාතේ ආර්ථික සංවර්ධනයට කටයුතු සිදු කිරීම.
   4. පරිපාලන සැලසුම් සකස් කිරීම මෙන්ම ක්‍රියාත්මක කිරීම.

16. පළාත් පාලන ආයතනයක ප්‍රතිපත්ති සම්පාදනය කරනු ලබන ආයතනය හඳුන්වනුයේ,
   1. සෙනෙට් සභාව
   2. රාජ්‍ය සභාව
   3. මහ සභාව
   4. ජාතික සභාව

17. පරිපාලන බලතල අනුව විමධ්‍යගත කිරීම පිළිවෙලින් දක්වනුයේ,
   1. ග්‍රාම නිළධාරි, ප්‍රාදේශීය ලේකම්, අමාත්‍යාංශ ලේකම්, දිස්ත්‍රික් ලේකම්
   2. දිස්ත්‍රික් ලේකම්, ග්‍රාම නිළධාරි, ප්‍රාදේශීය ලේකම්, අමාත්‍යාංශ ලේකම්
   3. ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිළධාරි, දිස්ත්‍රික් ලේකම්, අමාත්‍යාංශ ලේකම්
   4. ග්‍රාම නිළධාරි, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම්, අමාත්‍යාංශ ලේකම්

18. ස්විස්ටර්ලන්තයේ කැන්ටන නමින් හඳුන්වන ප්‍රාන්ත ආණ්ඩු සංඛ්‍යාව වනුයේ,
   1. 13
   2. 26
   3. 50
   4. 32

Past Papers Wiki

19. ජනවර්ග වලට අයත් නොවනුයේ,
1. සිංහල 2. බෞද්ධ 3. මුස්ලිම් 4. මැලේ

20. සංස්කෘතියට අයත් වන අංගයක් වනුයේ,
1. කඳු 2. වනාන්තර 3. ජලය 4. ඇඳුම් - පැළඳුම්

21. ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික ජන සමාජයක් ඇති වීමට මින් බලපෑ සාධකය වනුයේ,
1. කුඩා රාජ්‍යයක් වීම. 2. පිහිටීම සුවිශේෂී වීම.
3. කුඩා ජනගහනයක් සිටීම. 4. සිංහල ප්‍රධාන ජනවර්ගය වීම.

22. යහපාලනයේ අංගයක් වනුයේ,
1. අල්ලෂ දූෂණය ඉහළ යාම. 2. රාජ්‍ය පාලකයින් වගකීමෙන් තොරවීම.
3. රාජ්‍ය පාලනය ආකාර්යක්ෂම වීම. 4. විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීම.

23. අප රටේ භාවිත වන භාෂාවක් නොවන්නේ,
1. සිංහල 2. ඉංග්‍රීසි 3. හින්දි 4. දෙමළ

24. නූතන ජාතික රාජ්‍ය ගොඩනඟා ඇති පදනම වනුයේ,
1. එක් ජනවර්ගයක් ප්‍රධාන වේ යන්නයි. 2. එක් ආගමක් ප්‍රධාන වේ යන්නයි.
3. එක් ජාතියකට එක් භාෂාවක් යන්නයි. 4. එක් ජාතියකට එක් රාජ්‍යයක් යන්නයි.

25. ආර්ථික වශයෙන් යහපාලනයක් පවතින බව දැක්වෙන ප්‍රකාශය වනුයේ,
1. තමන් කැමති දේශපාලන මතවාදයක් දැරිය හැකිය.
2. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්විය යුතුයි.
3. ආදායම් බෙදීයාමේ විෂමතාව අවම කළ යුතුයි.
4. තමන් කැමති ආගමක් ඇදහිය හැකියි.

26. වෙනස්කම් තුළින් එකමුතු බව යන්න තේමා කරගත් සංවර්ධිත රටවලට උදාහරණ වනුයේ,

A. සිංගප්පූරුව B. ජපානය
C. චීනය D. ස්විස්ටර්ලන්තය

1. A සහ B 2. A සහ C 3. B සහ C 4. A සහ D

27. මූලික ආර්ථික ප්‍රශ්නයක් වනුයේ,
1. යොදා ගන්නා ශිල්පීය ක්‍රමය කුමක්ද?
2. කවුරු සඳහා නිෂ්පාදනය කරන්නේද?
3. නිෂ්පාදනය කරනුයේ කුමන අංශයෙන්ද?
4. ආර්ථික නොවන භාණ්ඩ යනු මොනවාද?

28. ආර්ථික නොවන භාණ්ඩයක් වනුයේ,
A. බෝතල් කළ ජලය
B. නයිට්‍රජන් වායුව
C. ජලය
D. හිරු එළිය

1. A සහ C 2. B සහ C 3. A සහ D 4. C සහ D

PAST PAPERS WIKI

29. ආර්ථිකයක සිදුවන ක්‍රියාවලියකට අයත් නොවේ,
1. නිෂ්පාදනය
2. ප්‍රාග්ධනය
3. බෙදා හැරීම
4. පරිභෝජනය

30. අන්තර් භාණ්ඩයක් වනුයේ,
1. දැව
2. ඖෂධ
3. ඇඳුම් - පැළඳුම්
4. යන්ත්‍ර සූත්‍ර

31. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වා දුන් වර්ෂය වනුයේ,
1. 1997
2. 1961
3. 1970
4. 1972

32. සමාජවාදී ආර්ථික ක්‍රමයක ලක්ෂණයක් වනුයේ,
1. තරඟකාරී වෙළඳපොළක් පැවතීම.
2. මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මඟින් ආර්ථිකය මෙහෙය වීම.
3. ලාභය අරමුණු කරගෙන නිෂ්පාදනය කිරීම.
4. ආදායම් අසමාන ලෙස බෙදී යාම.

33. ශ්‍රී ලංකා ආර්ථිකයේ දක්නට නොලැබෙන ලක්ෂණයක් වනුයේ,
1. රාජ්‍ය ආයතන තරඟකාරී වෙළඳපොළ හා විවෘත කිරීම.
2. යටිතල පහසුකම් පුළුල් කිරීම.
3. රජය විනිමය පාලනයෙන් ඉවත් වීම.
4. රාජ්‍ය ව්‍යවසායන් පෞද්ගලීකරණය කිරීම.

34. මතවාදී ගැටුමකට උදාහරණයක් වනුයේ,
1. ඊශ්‍රායල, පලස්තීන ගැටුම
2. දෙවන ලෝක සංග්‍රාමය
3. බටහිර හා පෙරදිග සංස්කෘති අතර ගැටුම
4. ඉන්දු - පකිස්ථාන ගැටුම

35. රුවන්ඩාවේ ටුට්සිවරු හා හුටුවරු අතර ඇතිවන ග්‍රෝත්‍රික ගැටුමට මූලික වන ගැටුම් මූලය වනුයේ,
1. වාර්ගිකත්වය
2. දේශපාලනය
3. සමාජ ආර්ථික තත්වය
4. ආගමික මතවාද

36. අධිකරණ මැදිහත් වීමක් සහිත ගැටුම් නිරාකරණ ක්‍රමවේදය වන්නේ,
1. සාකච්ඡා කිරීම.
2. විනිසීම
3. බේරුම් කිරීම.
4. කේවල් කිරීම.

37. වෘත්තිය ක්ෂේත්‍රය තුළ සේවා සේවක දෙපාර්ශවයේ ගැටලු විසඳීමට වඩාත් සුදුසු ක්‍රමවේදය,
1. කේවල් කිරීම.
2. මැදිහත්කරණය
3. සාකච්ඡා කිරීම.
4. උපදේශනය

38. සමථකරණය සඳහා අධිකරණ අමාත්‍යාංශය මඟින් ස්ථාපිත ආයතනයක් වන්නේ,
1. ග්‍රාමෝදය මණ්ඩලය
2. සමථ මණ්ඩලය
3. සර්වෝදය
4. මහේස්ත්‍රාත් අධිකරණය

39. ගැටුම් නිරාකරණය සඳහා පුරවැසියෙකු තුළ තිබිය යුතු සාමාජීය ගුණාංගයක් වන්නේ,
1. නිර්මාණාත්මක බව
2. සංවේදී බව
3. අන්මන ගරු කිරීම.
4. ආත්මාවබෝධය.

40. පුද්ගලයෙකු තුළ, පුද්ගලයන් අතර, පවුල තුළ ඇතිවන ගැටුම් හඳුන්වනුයේ,
1. පුද්ගල ගැටුම්
2. සූක්ෂම ගැටුම්
3. සාර්ව ගැටුම්
4. වාර්ගික ගැටුම්

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	10 ශ්‍රේණිය	පුරවැසි අධ්‍යාපනය II	කාලය / நேரம் / Time: පැය 02යි

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

අමතර කියවීම් කාලය මි.10යි

- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න 04ක් ද ඇතුළුව ප්‍රශ්න 05කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

---

01. i. අතීතයේ රාජ්‍යයන් පාලනය කිරීම සඳහා යොදාගත් පාලන ක්‍රම 02ක් නම් කරන්න.

ii. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ 02ක් නම් කරන්න.

iii. මධ්‍යම ආණ්ඩුවේ බලය විමධ්‍යගත කරන ස්වරූප 02ක් නම් කරන්න.

iv. සන්ධීය ආණ්ඩු ක්‍රමයක පැවතිය හැකි නීති 02ක් දක්වන්න.

v. ඇමරිකා එක්සත් ජනපද ව්‍යවස්ථාදායකය වන කොංග්‍රස් මණ්ඩලය සමන්විත ආයතන 02ක් නම් කරන්න.

vi. ස්විස්ටර්ලන්තයේ භාවිත වන නිල භාෂා 02ක් නම් කරන්න.

vii. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික වීම කෙරෙහි බලපා ඇති සාධක 02ක් ලියන්න.

viii. වෙළඳාම සිදුවන ප්‍රධාන ආකාර 02ක නම් කරන්න.

ix. බෙංගාල මුහුදු තීරය අවට රටවල් පිහිටුවා ගත් ආර්ථික සහයෝගිතා සංගමය (BIMST - EC) අයත් රටවල් 02ක් නම් කරන්න.

x. අන්තර්ජාතික ගැටුම් බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.

(ල.2X10 = 20)

02. ජාතික රාජ්‍ය "එක් ජාතියක් සඳහා එක් රාජ්‍යයක්" යන සංකල්පය මත පදනම් වී ඇත.

i. රාජ්‍යයේ අංග ලකෂණ 02ක් ලියන්න. (ල.02)

ii. ජාතික රාජ්‍යය බිහිවීමට බලපාන හේතු 03ක් ලියන්න. (ල.03)

iii. රාජ්‍යයට පැවරී ඇති කාර්යයන් 03ක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල.05)

03. ශ්‍රී ලංකාවේ බලය බෙදා හැරීමට ගත් උත්සහායක් ලෙස පළාත් සභා පිහිටුවීම පෙන්වා දිය හැකි වේ.

i. පළාත් සභාවක ආයතනික ව්‍යුහය රූප සටහනකින් පෙන්වන්න. (ල.02)

ii. පළාත් සභාවක බලතල ලැයිස්තු 03 නම් කරන්න. (ල.03)

iii. පළාත් ආණ්ඩුකාරවරයා යන තනතුර හඳුන්වා බලතල හා ඔහුට අයත් කාර්යයන් 03ක් ලියන්න. (ල.05)

Past Papers Wiki

04. i. ඔබ දන්නා ජනවර්ග 02ක් නම් කරන්න. (ල.02)

ii. බහු සංස්කෘතික සමාජයක හා පැවැත්ම සඳහා පුරවැසියෙකු විසින් ප්‍රගුන කළ යුතු ගුණාංග 03ක් ලියන්න. (ල.03)

iii. බහු සංස්කෘතික ජන සමාජයක් ශක්තිමත් කිරීමට ඔබ කරන යෝජනා 03ක් ලියන්න. ඉන් එකක් පැහැදිලි කරන්න. (ල.05)

05. i. ආර්ථික ක්‍රමයක් යනු කුමක්ද? (ල.02)

ii. මූලික ආර්ථික ප්‍රශ්න 03ක් නම් කරන්න. (ල.03)

iii. නිෂ්පාදන සාධක 03ක් නම් කර, ඉන් එකක් පැහැදිලි කරන්න. (ල.05)

06. i. නිෂ්පාදනය යනු කුමක්ද? (ල.02)

ii. නිෂ්පාදන බෙදිය හැකි අංශ 03ක් නම් කරන්න. (ල.03)

iii. නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව බෙදෙන කොටස් 03 නම් කරන්න. ඉන් එකක් විස්තර කරන්න. (ල.05)

07. i. ගැටුම් ඇතිවන මූල 02 නම් කරන්න. (ල.02)

ii. ගැටුම් නිරාකරණ ක්‍රම 03ක් නම් කරන්න. (ල.03)

iii. ජොහාන් ගැල්ටුන්ගේ ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ඇඳ නම් කරන්න. ඉන් එකක් විස්තර කරන්න. (ල.05)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library